සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

නර්තනය (භරත) I
நாட்டியம் (பரதம்) I
Dancing (Bharatha) I

53 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන වරණවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** නඩරාජා දිව්‍යමය ස්වරූපයේ දර්ශනය තුළ දෙවියන්ගේ සදාතනික ස්වභාවය පෙන්නුම් කරනු ලබන්නේ,
(1) තිරුක්කරම් වේ. (2) පූනූල් වේ. (3) තීයකල් වේ.
(4) තිරුච්චෙවි වේ. (5) නීලකණ්ඩ වේ.

**2.** සාත්වික භාවයන්හි 'වේබදු' යන්න,
(1) කඳුළු සැලීම ය. (2) වර්ණ වෙනස්වීම ය. (3) වෙව්ලීම ය.
(4) ක්ලාන්ත වීම ය. (5) දහඩිය දැමීම ය.

**3.** තිස්ර ජාදි මට්ටිය තාලය මිශ්‍ර ගදි ගත වීමේ දී ලැබෙන සංඛ්‍යාව,
(1) 35 කි. (2) 49 කි. (3) 56 කි. (4) 70 කි. (5) 77 කි.

**4.** පූජා තාලය වාදනය කර ආරම්භ කරනු ලබන කුතු වන්නේ,
(1) පරෛරමේල කුතු වේ. (2) වඩමෝඩි කුතු වේ.
(3) තෙන්මෝඩි කුතු වේ. (4) වසන්තන් කුතු වේ.
(5) වාසාප්පු කුතු වේ.

**5.** භරත මුනිවරයා නාට්‍ය ශාස්ත්‍රය රචනා කළේ කුමන භාෂාවෙන් ද?
(1) කන්නඩ (2) හින්දි (3) තෙළිඟු
(4) පාලි (5) සංස්කෘත

**6.** නායකයන්ගේ පණිවිඩකරුවන් ලෙස හඳුන්වනු ලබන්නේ කවුරුන් ද?
(1) සඩන්, වෛශිකන්, විඩන් සහ ත්‍රෂ්ටන් (2) විඩන්, චේඩන්, සඩන් සහ අනුකූලන්
(3) පීඩමර්ත්තන්, විඩන්, චේඩන් සහ විදූෂකන් (4) පීඩමර්ත්තන්, චේඩන්, සඩන් සහ විදූෂකන්
(5) විඩන්, චේඩන්, විදූෂකන් සහ වෛශිකන්

**7.** ශෘංගාර රස සඳහා භාවිත කරන ස්වර වනුයේ,
(1) ගාන්ධාර සහ නිශාධ ය. (2) සට්ජම් සහ රිෂබ ය. (3) නිෂාධ සහ සට්ජම් ය.
(4) මධ්‍යම සහ පංචමම් ය. (5) මධ්‍යම සහ සට්ජම් ය.

**8.** නාට්‍ය ශාස්ත්‍රයේ එකොළොස්වන පරිච්ඡේදයේ සඳහන් වන විෂය කරුණ කුමක් ද?
(1) මණ්ඩල (2) චාරි චලන (3) රස
(4) වේදිකා (5) තාල භාණ්ඩ



Department of Examinations, Sri Lanka

9. චාරි භේදයේහි භාවිත කරනු ලබන පාද තැබීම වන්නේ,
(1) කුට්ටනම් වේ. (2) මෝඩිතම් වේ. (3) අලකම් වේ.
(4) ආලීඩම් වේ. (5) ප්‍රත්‍යාලීඩම් වේ.

10. "කලි යුග වරදන් කණ්කණ්ඩ දෙයිවමායි කාට්චි යළිප්පදු පළයිලේ..." යන්න
(1) විරුත්තම් වේ. (2) පදවර්ණම් වේ. (3) කීර්තනම් වේ.
(4) සබ්දම් වේ. (5) තිරුපුකල් වේ.

11. ;;;; තකිට තදිංගිණතොම් | තකිට තදිං ගිණතොම් |
තකිට තදිංගිණතොම් //
ඉහත සඳහන් තාල අංගයෙන් නිර්මාණය විය හැකි 'තදිංගිණතොම්' පිහිටා ඇති ජාදි වන්නේ,
(1) තිශ්‍ර ය. (2) චතුස්‍ර ය. (3) කණ්ඩ ය.
(4) මිශ්‍ර ය. (5) සංකීර්ණ ය.

12. 'අභිසාරිකා' යන නායකීගේ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා මොනවා ද?
(1) මන්මද පූජා සහ ජල ක්‍රීඩාව
(2) නොනිදා සිටීම සහ ශාරීරික වෑහැරීම
(3) කඳුළු සැලීම සහ සිහි නැතිවීම
(4) ස්වාමියා සමග එකට ජීවත්වීම පිළිබඳ සිහින දැකීම සහ මනඃකල්පිතයන් තුළ නියැලීම
(5) මුමුණමින් කතා කිරීම සහ හැඟීම්බර වීම

13. කතකලි නර්තනයේ සාත්විකත්වය සහ අලංකාරය (සිරුංගාරම්) යනාදිය නියෝජනය කරන වර්ණ පිළිවෙළින්
(1) රත සහ ලා කොළ ය. (2) කොළ සහ සුදු ය. (3) කොළ සහ ලා කොළ ය.
(4) කහ සහ රතු ය. (5) නිල් සහ ලා කොළ ය.

14. "වේලවරේ උමෛත් තේඩි ඔරු මඩන්තෛ විඩියුමලවු කාත්තිරුක්කිරාල් වකෛයෙන්න..." යන පද පෙළෙන් පිළිබිඹු කරනු ලබන නායකී වන්නේ,
(1) කණ්ඩිතා ය. (2) අභිසාරිකා ය. (3) විප්‍රලබ්ධා ය.
(4) ස්වාධීනපතිකා ය. (5) වාසක සජ්ජිකා ය.

15. රූකඩ සංදර්ශනයක් ලෙස ඉදිරිපත් කරන ලද කලා කෘතිය
(1) භාගවත මේලා ය. (2) කුට්ට්‍රාල කුරවංජි ය. (3) කූඩියාට්ටම් ය.
(4) කාවඩිචින්දු ය. (5) යක්ෂගානම් ය.

16. කර්ත්තරී අඩව්ව එකවරක් සම්පූර්ණයෙන් ඉදිරිපත් කරන පාද තැබීම ඇතුළත් පාද භේදය වන්නේ,
(1) උත්ප්ලවන භේදය (2) භ්‍රමරී භේදය (3) ස්ථානක භේදය
(4) මණ්ඩල භේදය (5) පාදචාරිකා භේදය

17. "අණ්ණලුම් නෝක්කිනාන් අවලුම් නෝක්කිනාල්" යන්නෙහි 'අණ්ණල්' යන්න නිරූපණය සඳහා වම් සහ දකුණු අත්වල භාවිත කරනු ලබන මුද්‍රා පිළිවෙළින්
(1) මුෂ්ටි සහ පතාක වේ. (2) පතාක සහ කපිත්ථ වේ. (3) ත්‍රිශූල සහ ශිකර වේ.
(4) කපිත්ථ සහ ශිකර වේ. (5) ත්‍රිපතාක සහ අර්ධචන්ද්‍ර වේ.

18. පාණ්ඩ කුට්ටිමම් සහ ශර්වතෝපත්‍රම් යන නෘත්‍යයන් නර්තනය කරනු ලබන දේවාලය වනුයේ,
(1) ශිව දේවාලය ය. (2) වීරභද්‍ර දේවාලය ය. (3) විෂ්ණු දේවාලය ය.
(4) අයියප්පන් දේවාලය ය. (5) වෛරවර් දේවාලය ය.

19. ත්‍රිපතාක, කටකාමුඛ, අලපද්ම යන මුද්‍රා පමණක් භාවිත කරමින් නර්තනයෙහි යෙදෙන අඩව් වන්නේ,
(1) පළමු පරවල් අඩව්ව සහ පළමු කුදිත්තු මෙට්ටඩව්ව
(2) පස්වෙනි නාට්ටඩව්ව සහ දෙවන කුදිත්තු මෙට්ටඩව්ව
(3) තුන්වෙනි තත්තෙයිතාහා අඩව්ව සහ දෙවෙනි තත්තෙයිතාම් අඩව්ව
(4) හතරවෙනි පරවල් අඩව්ව සහ අටවෙනි නාට්ටඩව්ව
(5) තුන්වෙනි කුදිත්තු මෙට්ටඩව්ව සහ හතරවෙනි තත්තෙයිතාහා අඩව්ව

Department Of Examinations , Sri Lanka

**20.** 'කොහොඹා කංකාරිය' චාරිත්‍රයේ ඇතුළත් උපකොටස් චාරිත්‍රයක් වන්නේ,

(1) බොරු යක්කමයි. (2) කිරි මඩුවයි. (3) පහන් මඩුවයි.
(4) සූනියම් යාගයයි. (5) රට යැකුමයි.

**21.** කණ්ඩ ජාති ධ්‍රුව තාලයෙහි අංග සංකේතය කුමක් ද?

(1) $|_5 O |_5 |_5$ (2) $|_5 O |_5$ (3) $|_5 \cup O$
(4) $|_5 |_5 O O$ (5) $|_5 O O$

**22.** ශිව ලෝකය පිළිබඳ ඉදිරිපත් කරන වන්නම් නර්තනය කුමක් ද?

(1) අශ්ත්‍රුශ වන්නම (2) ඊරඩි වන්නම (3) ශූරපති වන්නම
(4) වෛරෝඩි වන්නම (5) නෛයඩි වන්නම

**23.** ශෘංගාර රසයේ උද්දීපනය වන අත්දැකීම් හා මනෝභාව අනුව නායකී ප්‍රභේද ගණන කීය ද?

(1) 4 කි. (2) 8 කි. (3) 12 කි. (4) 16 කි. (5) 24 කි.

**24.** උතුරු ඉන්දියාවේ කතක් නර්තනය ප්‍රචලිතව පවතින ප්‍රදේශ වනුයේ,

(1) රාජස්තාන්, ගුජරාට්, උත්තර ප්‍රදේශ් සහ මධ්‍ය ප්‍රදේශ් ය.
(2) රාජස්තාන්, ගුජරාට්, උත්තර ප්‍රදේශ් සහ ක්‍රිෂ්ණ දිස්ත්‍රික්කය ය.
(3) රාජස්තාන්, ගුජරාට්, ක්‍රිෂ්ණ දිස්ත්‍රික්කය සහ මධ්‍ය ප්‍රදේශ් ය.
(4) රාජස්තාන්, ගුජරාට්, උත්තර ප්‍රදේශ් සහ කේරළ ප්‍රාන්ත ය.
(5) රාජස්තාන්, ගුජරාට්, ඔරිසා සහ මධ්‍ය ප්‍රදේශ් ය.

**25.** තිරුමයිලෛ කීර්තනෛ රචනා කළේ කවුද?

(1) කලෛච්චෙල්වන් ඊරම්බු සුබ්බෙයියා
(2) අළවෙයූර් විනාචිත්තම්බි පුලවර්
(3) නවාලියූර් සෝමසුන්දර පුලවර්
(4) බ්‍රහ්ම ශ්‍රී වීරමණී අයියර්
(5) ස්වාමි විපුලානන්ද අඩිකලාර්

**26.** 1928 වර්ෂයේ දී නිල වශයෙන් ආරම්භ කරන ලද කලායතනය කුමක් ද?

(1) චෙන්නායි සංගීත ඇකඩමිය
(2) කලා ක්ෂේත්‍රය
(3) ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය
(4) රාමනාදන් ලලිත කලා පීඨය
(5) වඩ ඉලංගෛ සංගීත සබෛ

**27.** භාගවත මේලා නර්තන දර්ශන සඳහා වේදිකාව අලංකාර කිරීමට භාවිත කරන වර්ණය

(1) රතු ය. (2) කහ ය. (3) නිල් ය. (4) සුදු ය. (5) රෝස ය.

**28.** "උත්තක්කිට්ට ගින්නත් තොංග..." යන ගණපති ගෞත්තුවම් රචනා කළේ කවුරුන් ද?

(1) මුත්තුත්තාණ්ඩවර් (2) මුත්තුකුමාර නට්ටුවනාර්
(3) සුප්පරාය නට්ටුවනාර් (4) අරුණාචල නට්ටුවනාර්
(5) ගංගෛමුත්තු නට්ටුවනාර්

**29.** ඊරෝඩ් සහ පාලාව් ප්‍රදේශවල 'තප්පු' වාදනය කර වන්දනා කිරීම හඳුන්වන නම කුමක් ද?

(1) තප්පු මුරිප්පු (2) තප්පු කළිප්පු (3) තප්පාට්ටම්
(4) තප්පුච්චේවෛ (5) තප්පුප්පරවල්

Department Of Examinations , Sri Lanka

**30.** වන්නෙ කාමාට්චි සුන්දරම් සහ මීණාට්චි සුන්දරම් යන දෙදෙනාගෙන් මෘදංග වාදනය ඉගෙනගනු ලැබුවේ,
(1) බ්‍රහ්ම ශ්‍රී වීරමණී අයියර් ය. (2) ගීතාංජලී වී.කේ. නල්ලයියා ය.
(3) පද්ම ශ්‍රී අඩයාර් කේ. ලට්චුමනන් ය. (4) පද්මභූෂණ් සී.වී. චන්ද්‍රසේකරර් ය.
(5) පද්මභූෂණ් නරසිම්මාචාරියාර් ය.

**31.** 'සාට්සුශීය සාත්වීකම්' යන්න
(1) ඇස්වලින් භාව ප්‍රකාශ කිරීම වේ.
(2) දෑත්වලින් භාව ප්‍රකාශ කිරීම වේ.
(3) බෙල්ලෙන් භාව ප්‍රකාශ කිරීම වේ.
(4) හිසෙන් භාව ප්‍රකාශ කිරීම වේ.
(5) ඇඳුම් සහ ආභරණවලින් භාව ප්‍රකාශ කිරීම වේ.

**32.** කරුණා රසයෙහි විරුද්ධ රසය, වර්ණය හා දේවතාව පිළිවෙළින්
(1) හාස්‍යය, අළු පාට සහ යම වේ. (2) රෞද්‍ර, කහ පාට සහ බ්‍රහ්මන් දෙවියන් වේ.
(3) වීර, රතු පාට සහ විෂ්ණු දෙවියන් වේ. (4) භයානක, ලා රතු පාට සහ ඉන්ද්‍රන් වේ.
(5) ශාන්ත, නිල් පාට සහ ශිව දෙවියන් වේ.

**33.** "චින්න චින්න පාදම් වෙත්තු කණ්ණා නී වා..." යන පද පෙළ නිරූපණය කිරීම සඳහා භාවිත කරනු ලබන භක්තිය වන්නේ,
(1) මධුර භක්තියයි. (2) වාත්සල්‍ය භක්තියයි. (3) මූර්ක භක්තියයි.
(4) දාස්‍ය භක්තියයි. (5) සාක්කිය භක්තියයි.

**34.** ආනන්ද තාණ්ඩවම් සඳහා භාවිත කරනු ලබන අනෙක් නම කුමක් ද?
(1) සන්ධ්‍යා තාණ්ඩව (2) ඌර්තුව තාණ්ඩව
(3) පංචකිරුත්තිය පරමානන්ද තාණ්ඩව (4) ගෞරී තාණ්ඩව
(5) මුනි තාණ්ඩව

**35.** ත්‍රිකාල තීර්මානම් සමග ආරම්භ වන නර්තනාංගය වන්නේ,
(1) තිල්ලානා ය. (2) ජදීස්වරම් ය. (3) අලාරිප්පු ය.
(4) පදවර්ණම් ය. (5) සබ්දම් ය.

**36.** පුරත්තිනෙහි සතුරු රටක් ආක්‍රමණය කර, එරට එළදෙනුන් රැගෙන විත් තම රටේ ජනතාවට බෙදා දී පානය කර ප්‍රීතියෙන් නර්තනය කිරීම හඳුන්වනුයේ,
(1) කුරවංජි ලෙස ය. (2) කුරවෙ ලෙස ය. (3) වෙරියාඩල් ලෙස ය.
(4) තුණංගෛ ලෙස ය. (5) උණ්ඩාට්ටු ලෙස ය.

**37.** 'පට්ටුදල් මාත්‍රය' යනු
(1) දෙවියන්ගෙන් යහපත ලබාගැනීමේ අපේක්ෂාවෙන් නර්තනයේ යෙදීමයි.
(2) ශරීරය කරකවා නර්තනයේ යෙදීමයි.
(3) යක්ෂයින් සන්සුන් කිරීමේ ක්‍රියාවල යෙදෙන අවස්ථාවල නර්තනයේ යෙදීමයි.
(4) කෘෂිකර්මයේ යෙදී සිටින ග්‍රාමීය කාන්තාවන් නර්තනයේ යෙදීමයි.
(5) සංගීත රටා භාවිත කරමින් නර්තනයේ යෙදීමයි.

**38.** "පොයිදල් ආඩිය පොයියා මකලිර් කුප්පෙප වෙණ්මණල් කුරවෙ නිරූ උම්..." යන අයින්ගුරුනූරු පද පේළියෙන් හඳුන්වනු ලබන නර්තනය වන්නේ,
(1) නෙයිදල් තිලක්කුරවෙ ය. (2) මරුත තිලක්කුරවෙ ය.
(3) පාලෛ තිලක්කුරවෙ ය. (4) කුරිංජි තිලක්කුරවෙ ය.
(5) මුල්ලෛ තිලක්කුරවෙ ය.

Department of Examinations, Sri Lanka

**39.** උඩරට නර්තනයේ දී නිරූත්තම්, නිරූත්තියම් සහ නාට්‍ය කොටස් අනුපිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

(1) යක්හැනුම, හත්පදය සහ කොහොඹාහැල්ල

(2) ආවැන්දුම, දුනුමාලක්කුව සහ අස්නෙ

(3) ගුරුගේමාලාව, යක්කම් සහ ගබඩා කොල්ලය

(4) හත්පදය, ආවැන්දුම සහ ගුරුගෙමාලාව

(5) යක්කම, ගබඩා කොල්ලය සහ යක් හැනුම

**40.** තාලදස ප්‍රානයෙහි $\frac{|}{8}$ යන සංකේතයෙන් දැක්වෙන්නේ කුමක්ද ?

(1) අනුත්රුදම් (2) ගුරු (3) ලගුත්රුදම්

(4) කාකපාදම් (5) පුලුතම්

- අංක **41** සිට **45** දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරෙන් වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

| **ප්‍රදේශය** | **කුතු** | **සංගීත භාණ්ඩ** | **ගායන සංයුතිය** | **කතා නිර්මාණය/සංගීතය** |
|---|---|---|---|---|
| **A** | වඩමොඩි | යාල්<br>කුළල්<br>මුළවු | 'කන්තාර්ත්තම්' යන ගායන මෙට්ටු | රාම නාඩගම<br>කුසල නාඩගම |
| මන්නාරම | **B** | තවිල්<br>බටනලාව<br>මුරසු | දෙබස් සහිත ගීත සහ සින්දු | ක්‍රිස්තියානි පූජකවරුන් |
| යාපනය | තෙන්මෝඩි කුතු | **C** | සාම්ප්‍රදායික තනු | කතෝලික ආගම පාදක කරගත් ඒවා ය |
| මන්නාරම | තෙන්පාංගු | ඩොල්කිය<br>හාර්මෝනියම්<br>මෘදංගය | **D** | රාමායණය<br>මහාභාරතය |
| මඩකලපුව | මගිඩි කුතු | මගුඩි | මන්ත්‍ර තන්ත්‍ර | **E** |

**41.** **A** හි සඳහන් විය යුතු ප්‍රදේශය කුමක් ද?

(1) මන්නාරම (2) මඩකලපුව (3) කොළඹ

(4) කඳුකරය (5) කතරගම

**42.** **B** හි සඳහන් විය යුතු කුතු කුමක් ද?

(1) මගිඩි කුතු (2) කාත්තවරායන් කුතු

(3) වාසාප්පු කුතු (4) කාමන් කුතු

(5) අර්ජුනන් කුතු

**43.** **C** හි සඳහන් විය යුතු සංගීත භාණ්ඩ මොනවා ද?

(1) මගුඩි, වයලින් සහ වීණාව (2) මෘදංගය, සල්ලාරි සහ හාර්මෝනියම්

(3) තවිල්, මුරසු සහ බටනලාව (4) යාළ්, සංඛ සහ මුළවු

(5) පරෛ, මගුඩි සහ යාල්

**44.** **D** හි සඳහන් විය යුතු ගීත සංයුති මොනවා ද?

(1) කන්දාර්තම් සහ වංජිත්තුරෛ (2) සින්දු සහ දෙබස්

(3) ඔප්පාරි සහ ඒට්ටරපාට්ටු (4) තේවාරම් සහ කලිප්පා

(5) වෙන්පා සහ කවි

**45.** **E** හි ඇතුළත් විය යුතු කතා නිර්මාණය කුමක් ද?

(1) කාමන් කතා පුවත (2) අර්ජුනන් පාසුපතම් ලබාගත් කතා පුවත

(3) රාමායණ කතා පුවත (4) සිංගන් සහ සිංගි කතා පුවත

(5) කුසල නාට්‍ය කතාව



Department Of Examinations , Sri Lanka

**46.** මෙම රූපයෙහි දක්වා ඇති ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදායෙහි රාජ සභාවල නර්තනයේ යෙදුනේ කවුද?



(1) පීතර් කාලනියර්ගල්
(2) මාණික්කත්තාර්
(3) මෙයිත්තිකළ්
(4) බාහර් කාවන්යර්
(5) රිෂබත්තලියිලාර්

**47.** මෙම රූපයෙහි පෙන්වා දෙනු ලබන රසෙහි වර්ණය කුමක් ද?



(1) කොළ වර්ණය
(2) කළු වර්ණය
(3) කහ වර්ණය
(4) සුදු වර්ණය
(5) අළු වර්ණය

**48.** මෙම රූපයෙහි දැක්වෙන අවතාරය උදාහරණ කොට ගත් නායකයා කවුද?



(1) දීරෝදත්තන්
(2) දීරෝදාත්තන්
(3) දීරකාන්තන්
(4) දීරශාන්තන්
(5) දීරලලිතන්

**49.** මෙම රූපයේ සඳහන් මුණිවරයා පාද තබාගෙන සිටින ආකාරය කුමක් ද?



(1) සමසූචි
(2) පාර්ශ්වසූචි
(3) බ්‍රහ්මහස්ථාන
(4) මෝඩිත
(5) ඒකපාද

**50.** මෙම රූපයෙහි දැක්වෙන සංගීත භාණ්ඩය එල්ලාගෙන කැරකෙමින් නර්තනය කරනු ලබන නර්තන සම්ප්‍රදාය අයත් ශාස්ත්‍රීය නර්තනය කුමක් ද?



(1) කුච්චිපුඩි
(2) මෝහිනි ආට්ටම්
(3) ඔඩිසි
(4) කතක්
(5) මණිපුරි

* * *

Department Of Examinations , Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

නර්තනය (භරත) II
நாட்டியம் (பரதம்) II
Dancing (Bharatha) II

**53 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ I **කොටසේ පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **දෙකක්** ද II **කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

1. (අ) (i) මිශ්‍ර චාපු තාලයට නිර්මාණය වූ අලාරිප්පුහි රාගය හා නර්තන නිර්මාණය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) මිශ්‍ර චාපු තාලයට නිර්මාණය වූ අලාරිප්පු යන්න තාල අංග සංකේත සමග ලියන්න. (ලකුණු 08යි.)

(ආ) (i) ඔබ ඉගෙනගත් තිල්ලානාහි රාගය හා තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) ඉහත (i) හි සඳහන් රාගයට නිර්මාණය වී ඇති තිල්ලානාහි අනුපල්ලවි කෝර්වෙ තාල අංග සංකේත සහිතව ලියන්න. (ලකුණු 08යි.)

2. (අ) (i) මෝහිනි නර්තන ශිල්පීන් **දෙදෙනකුගේ** නම් හා එම නර්තනය සඳහා භාවිත කරනු ලබන සංගීත භාණ්ඩ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) මෝහිනි නර්තනය පිළිබඳ සටහන් අන්තර්ගත ග්‍රන්ථ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(ආ) (i) ඔඩිසි නර්තනය කරනු ලබන උත්සව **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(ii) ඔඩිසි නර්තනය නිර්මාණයවීම සඳහා හවුල් වූ සම්ප්‍රදායන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි.)

(ඉ) (i) මෙයිතිවරුන් නර්තනයෙහි යෙදුනු ශාස්ත්‍රීය නර්තනයෙහි වර්ධනයට රාජ ශ්‍රී භාග්‍යචන්ද්‍රා සිදුකළ සේවාවන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(ii) ඉහත (i) හි සඳහන් ශාස්ත්‍රීය නර්තනයට අදාළ නර්තන ක්‍රම විස්තර කරන්න. (ලකුණු 05යි.)

3. (අ) තාල දසප්‍රාන යන්න ශ්ලෝකවලින් ලියා, යදි පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

(ආ) 'භාව' යන්නෙහි අර්ථය විස්තර කර, එහි කොටස් එකිනෙක පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)



Department Of Examinations , Sri Lanka

## II කොටස

**4.** පහත සඳහන් කරුණු පාදක කරගෙන භරත නර්තන වේදිකා නිර්මාණය පැහැදිලි කරන්න.

(අ) වේදිකාව
(ආ) ශබ්දය
(ඉ) ආලෝකය
(ඊ) දෘශ්‍ය සංදර්ශනය (ලකුණු 05 × 4 = 20 යි)

**5.** භරත නර්තන කලාවේ ප්‍රවර්ධනය සඳහා සුවිශේෂී දායකත්වයක් ලබාදුන් පහත සඳහන් නර්තන ශිල්පීන්ගේ චරිතාපදානය සහ කලාවට කළ සේවාවන් විස්තර කරන්න.

(අ) ගනම් ඊ. ක්‍රිෂ්ණයියර් (ලකුණු 10යි.)
(ආ) කලෙලච්චෙල්වන් ඒරම්බු සුබ්බෙයියා (ලකුණු 10යි.)

**6.** නායක යුගයෙහි නර්තන කලාවේ සිදු වූ වර්ධනය සහ සුවිශේෂතා පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**7.** "ශ්‍රී ලංකාවේ සමකාලීන භරත නාට්‍ය රඟ දැක්වීමෙහිලා පිරිමි යොවුන් රංගන ශිල්පීන්ගේ ප්‍රවේශයේ වර්ධනයක් දක්නට ලැබේ." මෙම ප්‍රකාශයේ අදාළත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 20යි.)

**8.** පහත සඳහන් කරුණු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) කුරවෙව කුතු
(ආ) සංඛ
(ඉ) සබරගමු නර්තනය
(ඊ) තලිර්වෙරි ශිලා ලේඛන (ලකුණු 05 × 4 = 20යි.)

* * *

Department Of Examinations , Sri Lanka